පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

ශ්‍රේණිය - 9

තුන්වන වාරය - ඔක්තෝම්බර් - සතිය - 01

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

නිපුණතා මට්ටම : විධික්‍රම අනුගමනය කරමින් ප්‍රස්තාර කරයි.

අරමුණු -

- ප්‍රස්තාරකරණය යන්න විස්තර කරයි
- ප්‍රස්තාරකරණය යන්න හඳුනාගනියි
- සහයෝගයෙන් කටයුතු කරයි
- දැනුම හා අත්දැකීම් අනෙක් අය හා හුවමාරු කර ගනී
- සතුටින් විවේකය ගත කරයි

ක්‍රියාකාරකම : <u>**කවි පද ප්‍රස්තාර කරමු.(ක්‍රියාකාරකම - 03)**</u>

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ මාත්‍රා 3+3 හා 3+4 තාල රූපයේ කවි පද, බෙර පද පසුගිය සතියන්හිදී ප්‍රස්තාර කරන්නට ඇත.

දෙවන පියවර : එම ප්‍රස්තාර කළ ක්‍රමවේදයන් නැවත වරක් සිහියට නගාගන්න.

තුන්වන පියවර : මෙම සතියේදී ඔබ කඩතුරා, පන් නෙළීමේ, ගොයම්, සොකරි කවි ප්‍රස්තාර කළ යුතුව ඇත.

හතරවන පියවර : ඔබ උගත් ප්‍රස්තාරකරණ ක්‍රමවේදයන්ට අනුව පහත කවි ප්‍රස්තාර කළ හැකිදැයි බලන්න.

කඩතුරා කවි :- මාත්‍රා 3+3

| | |
|---|---|
| සිහින් සිනිඳු සළුව පැලඳ විත් උන් | මරගන |
| වහන්ස නුඹ අප අතහැර මන්ද මහන | උන |
| අහංකාර ඒ මරගන දැක්කා බුදු | ගුණ |
| මිහින්තලා ධාතු බලෙන් කඩතිර | හරිමින |

පන් නෙළීමේ කවි :- මාත්‍රා 3+3

| | |
|---|---|
| කොනින් කොනට පන් උදුරා | ගන්නේ |
| තැනින් තැනට පන් අහුරු | දමන්නේ |
| උනුනගේ පන් කොළ එක් | නොකරන්නේ |
| බැණුන් අහන්නට වෙයි | දැනගන්නේ |

ගොයම් කවි :- මාත්‍රා 4+4

| | |
|---|---|
| රන් දෑ කැති ගෙන නිති | සැරසෙනවා |
| රතුන් පටි ඉන වට | දිලිසෙනවා |
| රිවි දුටු පිණි බිඳු ලෙස පහ | වෙනවා |
| දුම්බර කෙතේ අපි ගොයම් | කපනවා |

සොකරි කවි :- මාත්‍රා 3+3 (සොකරි)

| | |
|---|---|
| සොකරී එන්නී සබයෙන් අවසර | ගන්නී |
| නැටුම් නටන්නී තාලෙට රාග | කියන්නී |
| පද අල්ලන්නී පියයුරු ලැම ෙ | සාලවන්නී |
| කැඩපත ගන්නි සුරතින් මුහුණ | බලන්නී |

කඩතුරා කවි :- මාත්‍රා 3+3

| | |
|---|---|
| සිද්ධ මුනිඳු වැඩසිට බෝ මුල | විදුරාසන |
| යුද්ධ කරන්නට දස බිම්බර විත් | පැරදුණ |
| වැද්ද නොදී හැම පිරිපත දුරලා | හරිමින |
| බුද්ධ රත්නෙ අනුහසයෙන් කඩතිර | හරිමින |

පන් නෙළීමේ කවි :- මාත්‍රා 3+3

| | |
|---|---|
| ගාන තෙල් සඳුන් වරලස ඔමරි | කොට |
| මූණ පුරා තෙල් ගාගෙන යන | කලට |
| මාන බලති මිණිවන් පන් තිබෙන | කොට |
| නෑනෝ නුඹත් එනවද පන් | නෙළන්නට |

ගොයම් කවි :- මාත්‍රා 3+3

| | |
|---|---|
| ඉරු දෙවියන්ගේ ඉර ගල | ගාවා |
| සඳ දෙවියන්ගේ සඳ ගල | ගාවා |
| සණ දෙවියන්ගේ කෝවිල | ගාවා |
| උපිත් කියමු කවි කෝවිල | ගාවා |

සොකරි කවි :- මාත්‍රා 3+3 (වෙදරාළ)

| | |
|---|---|
| වෙදා නටන්නේ පළමුව සබයට | එන්නේ |
| යොදා කියන්නේ තාලෙට ගත | වෙව්ලන්නේ |
| කුදා වැනෙන්නේ සබයේ කොක් | හඬලන්නේ |
| විදා පාන්නේ අත් දෙක තැගි | කියන්නේ |

සහායක ඉගෙනුම් ආධාරක

***

- e නැණ පියස - Course: 9 ශ්‍රේණිය නර්තනය
- වෙනත් youtube නාලිකා
    - තාල රංග you tube නාලිකාව - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය නර්තන අංශය
    -
- අතිරේක පොත්/ සඟරා - අත්රේක කියවීම් පොත 9 ශ්‍රේණිය නර්තනය